**ජාතික ශිල්ප සභාව - 2022**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ශිල්ප සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 48 වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම රු.13,664,002 ක් අතීතානුයෝගීව ගැලපීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි කරන ලද අගයන් දැක්වෙන සංසන්දනාත්මක වටිනාකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ නිවරදි කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුවේ. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නීතඥානුකූල හිමිකාරිත්වය සභාවට නොමැති වාහන 02 ක අළුත්වැඩියා හා නඩත්තු වියදම් වශයෙන් දරන ලද රු.2,345,300 ක් දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | වාහන දෙකට අදාල ප්‍රාග්ධන වටිනාකම් වන රු. 2,345,300 ක මුදල වත්කම් ගිණුමෙන් ඉවත් කරන බව දන්වා ඇත. | වියදම් නිවරදිව හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ගත කළයුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශිල්ප සභාව සතු පුහුණු ශිල්පිය මධ්‍යස්ථානවල ආදායම්, වියදම් හා බැංකු ශේෂ පිළිබඳ දත්ත මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර මධ්‍යස්ථාන 83 ක බැංකු ශේෂ වටිනාකම රු.2,861,581 ක් හෙළිදරව් කර නොතිබුණි. | ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන වල ගනුදෙනු පහසු කිරීම සඳහා පමණක් ගිණුම් විවෘත කර ඇති අතර ආදායම්, වියදම් හා බැංකු ශේෂයන් ඇතුලත් වාර්තාවක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇත. | සියලු බැංකු ගිණුම් විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |
| (ඇ) | 2008 වර්ෂයේ කැබිනට් අනුමැතිය මත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට අයත්ව තිබූ රු.46,298,422 ක වත්කම් ජාතික ශිල්ප සභාව වෙත පවරා ඇති බැවින් එම වටිනාක ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ගිණුම්වලින් ඉවත් කර ඇතත් එම වටිනාකම සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදාල වත්කම් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබයි | මූල්‍ය ප්‍රකාශන වල ගැළපුම් කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ඈ) | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය සතු වාහන 2 ක ප්‍රත්‍යාගණන වටිනාකම රු.2,800,000 ගිණුම්වල දක්වා තිබුණි. | 2023 වර්ෂයේ නිවරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගණුදෙණු සටහන් කළ යුතුවේ. |
| (ඉ) | කාර්මික සංවර්ධන මණ්ඩලයට වේවැල් යන්ත්‍ර 3 ක් නිෂ්පාදනය කිරීම සඳහා ගෙවන ලද රු.3,850,740 ක අත්තිකාරම් මුදලට අදාල යන්ත්‍ර 03 ලැබී නොතිබියදී මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වශයෙන් හා ඒ වෙනුවෙන් රු.384,230 ක් ක්ෂය වීම් ගිණුම්ගත කර තිබුණි. | මෙම වත්කම් මෙතෙක් ජාතික ශිල්ප සභාවට ලබාදී නොමැති බැවින් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මෙම වත්කම් ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත්කර ලැබියයුතු ගිණුමට ගලපා 2023 වර්ෂයේ ගිණුම් නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ගණුදෙණු සටහන් කළ යුතුවේ. |
| (ඊ) | ඩුබායි Expo වෙළඳ ප්‍රදර්ශනයේ දී ණය කාඩ්පත් මගින් වූ අලෙවියෙන් AED 2,547.88 ක මුදලක් (දළ වශයෙන් රු.204,550 ක්) සභාව වෙත ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය වෙතින් ලැබිය යුතු වුවත් එය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | Expo 2020 ප්‍රදර්ශනයේ ණයකාඩ්පත් මත වූ අලෙවියෙන් ලද AED 2547.88 ක මුදල මේ වනවිට Dubai Consul General කාර්යාලය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හරහා මේ වන විට අයකර ගැනීමට හැකිවිය. | ලැබිය යුතු ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | දේපල පිරියත හා උපකරණ | 208,155,168 | 189,315,144 | 18,840,024 | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු නිවැරදි ශේෂයන් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ලක් ශිල්ප ප්‍රදර්ශනාගාරවල අවසාන තොග | 10,672,970 | 14,965,378 | 4,022,408 | සියළුම මිලදී ගැනිම් ලක් ශිල්ප මිලදීගැනීම් යටතේ ඇතුළත් කර ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත අලෙවි කරන ලද භාණ්ඩ වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු.2,432,122 ක ශේෂයක් හා සභාව විසින් එම ආයතනයට ගෙවිය යුතු රු.84,600 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවති අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද සභාව අපොහොසත් වී තිබුණි. | ලක්සල ආයතනයෙන් අයවිය යුතු මුදල සම්බන්ධයෙන් විස්තරාත්මක ලිපියක් 2023.04.10 දින යොමු කර ඇත. ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් ඉදිරි විගණන හා කලමණාකරණ කමිටුවේ උපදෙස් පරිදි කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2021 වර්ෂයේ ජනාධිපති හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙන්කර ගැනීමට රු.500,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. එසේ වුවද, 2021 හා 2022 වර්ෂ සඳහා හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය පවත්වා නොතිබූ අතර, විගණිත දින වන විටත් තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 සැප්තැම්බර් 11 සිට 18 දින දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇති ජාත්‍යන්තර හස්ත කර්මාන්ත ප්‍රදර්ශණයේ ඉඩ පහසුකම් වෙන්කිරීම සඳහා මෙම මුදල් භාවිතා කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ කාර්යය ඉටු නොකරන්නේ නම් නියමිත කාලපරිච්ඡේදය තුළම තැන්පත් මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

1.7 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීතිරීති /රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 වැනි ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින දහයක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් සභාවේ නිලධාරීන් වෙත අවස්ථා 29 කදී නිකුත් කර තිබූ රු.1,556,500 ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාද වී පියවා තිබුණි. | ප්‍රමාදයන් වළක්වා ගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ තායිලන්තයේ පැවැත් වූ 67th YWCA Diplomatic Charity Bazaar අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන හා 55th Diplomatic Red Cross Bazaar වෙළඳ ප්‍රදර්ශනය සඳහා ජාතික ශිල්ප සභාව විසින් කි.ග්‍රෑ.61.644 බරැති නිර්මාණ අයිතම ඉදිරිපත් කර තිබුණද ඉන් ඉතිරි වූ අයිතම පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉතිරි භාණ්ඩ සියල්ල තානාපති කාර්යාලය විසින් OTOP CITY – 2022 අළෙවිපොල වැඩසටහන සඳහා යොමුකර ඇති බව දන්වන ලදි. | ඉතිරි භාණ්ඩ සභාව වෙත නොපමාව ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය | වේවැල් යන්ත්‍ර මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව සහ වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානයේ ගෑස් පෝරණුව සඳහා විමිනියක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා සැපයුම්කරුවන්ගෙන් කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | අදාල ගෙවීම් කිරීමේදී 10% ක රඳවා ගැනීමක් සහිතව ගෙවීම් සිදු කරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,877,209 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,260,754 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,383,545 ක පිරිහීමක්

නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය නොකිරීම හා සංවර්ධන වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තඹ පිරිපහදු කිරීමේ සැලැස්මක් නොමැතිව මිලදීගත් තඹ කිලෝ ග්‍රෑම් 6820 ක තොගයෙන් කිලෝ ග්‍රෑම් 3770 ක තොගයක් අනාරක්ෂිතව මධ්‍යස්ථාන පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. ඉකුත් වර්ෂයේදී අනාරක්ෂිතව තිබූ වටිනාකම රු.1,301,475 ක තඹ කිලෝග්‍රෑම් 2086.50 ක් අස්ථානගත වී ඇති බව විමර්ශන වාර්තාව අනුව නිරීක්ෂණය විය. | මෙම තඹ රැහැන් තොගය ගබඩා කර පැවතියේ සාමාන්‍ය රජයේ ආයතනයක පවතින සියළුම ආරක්ෂිත අවශ්‍යතා සම්පූර්ණ කර තිබූ ආයතන පරිශ්‍රයකය. | අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සභාව විසින් ඉනිසියුලේටර් නිෂ්පාදනය සඳහා පවරන ලද කොන්ත්‍රාත්තුවේදී කොන්ත්‍රාත්කරු විසින් සභාවට අයත් වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානයේ යන්ත්‍ර හා උපකරණ,විදුලිය හා ජලය භාවිතා කරමින් නිෂ්පාදන කටයුතු කර තිබුණද සභාව විසින් දරන ලද වියදම කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතනය භාවිතා කරන ලද ඉඩකඩ හා යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීමට කටයුතු කර ඇත. | මධ්‍යස්ථානය පරිහරණය වෙනුවෙන් ගාස්තු අයකළ යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙළින් රු.6,925,622 ක් හා රු.111,012 ක් වැය කර සකස් කරන ලද ජාතික ශිල්ප සභා වෙබ් අඩවිය මගින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් නිෂ්පාදන මාර්ගගත ක්‍රමයට අලෙවි කිරීම සැලසුම් කර තිබුණද, 2021 හා 2022 වර්ෂවලදී මාර්ගගත ක්‍රමයට කරන ලද අළෙවි වටිනාකම රු.61,109 ක් වුයෙන් එම වෙබ් අඩවිය භාවිතා කිරීමේ උපරිම කාර්යක්ෂමතාවයක් නිරීක්ෂණය නොවීය. | ලක්ශිල්ප විද්‍යුත් වෙබ් අඩවිය මගින් අලෙවි කිරීමේදි පැන නැගී ඇති ගැටළු විසඳා මුහුණු පොතෙහි දැන්වීම් ප්‍රසිද්ධ කර සියළු පලාත් නිළධාරීන් දැනුවත් කර ජාතික ශිල්ප සභාවේ ලියා පදිංචි හස්ත කර්මාන්ත ශිල්පින් ගෙන් නිර්මාණ මිලදී ගැනීමේ කමිටු මගින් මිලදී ගෙන එම නිර්මාණ ලක්ශිල්ප වෙබ් අඩවිය සඳහා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත. | වෙබ් අඩවියෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහවැලි B ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂය තුළදී රු.34,681,964 ක් වැය කර මිලදී ගත් හණ පැල 44,000 කින් පැල 36,000 ක් පමණක් සිටුවා තිබුණද විගණන දිනය වන විට වගාවෙන් සියයට 95 ක් විනාශවීමට හේතුව ලෙස, ව්‍යාපෘතිය නිසි අධීක්ෂණය හා නඩත්තු සිදු නොකිරීම අසාර්ථකත්වයට සෘජුවම බලපා ඇති බව නිරීක්ෂණය විය. | 2022 වසරේ මහවැලි B කලාපයේ සිටුවන ලද පැළ වලින් සියයට 95 ක් විනාශ වී තිබූ බැවින් එම භූමි ප්‍රදේශය ආවරණය වන පරිදි තල් සංවර්ධන මණ්ඩලයෙන් නොමිලේ ලබා ගත් තල් බීජ 4700 ක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහය ඇතිව සිටුවීමට කටයුතු කර ඇත. | රජයේ මුදල් අරපිරිමැස්මෙන් වඩාත් ඵලදායීව ආයෝජනය කළ යුතුවේ. |
| (ඇ) | සභාව විසින් 2021 වර්ෂය තුලදී ශිල්ප සමාජ 97 ක් පිහිටුවා තිබුණද 2022 වර්ෂයේ දී පිහිටුවා ඇති ශිල්ප සමාජ සංඛ්‍යාව 24 කි. එය වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි දක්වා ඇති ඉලක්ක ශිල්ප සමාජ සංඛ්‍යාවෙන් සියයට 48 කි. ඒවා මැටි, බීරළු රේන්ද, පිත්තල කැටයම්, තල්කොල, උණ බට, පොල් ආශ්‍රිත, ස්වර්ණාභරණ, ඉදිකොළ ලී බඩු හා පන් යන කේෂ්ත්‍ර වන අතර, ප්‍රධාන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද හණ හා වේවැල් වලට අදාලව ශිල්ප සමාජ පිහිටුවා නොතිබුණි. | අමුද්‍රව්‍ය නොමැති කමින් සත්‍ය වශයෙන්නම සිය ජීවනෝපාය අවධානමකට ලක්ව ඇති ශිල්පීන්ට ප්‍රතිලාභ ලැබෙන පරිදි මෙම වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.<br>වේවැල් හා හණ කර්මාන්තයේ නියැලෙන ශිල්පීන් බහුල වශයෙන් ව්‍යාප්තව සිටින ගම්මාන වලට අදාල ශිල්ප සමාජ සියල්ල ස්ථාපිත කර ඇත. | ප්‍රධාන වගා ව්‍යාපෘති සඳහා ශිල්ප සමාජ පිහිටුවීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් හෙක්ටයාර 1.1165 ක් වූ රු.47,750,000 ක් වටිනාකමැති සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානය වසර 2 ½ ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානයේ ලක්ශිල්ප අළෙවි සැල සඳහා නිර්මාණ ප්‍රදර්ශන රාක්ක 12 ප්‍රවාහනය කර අළෙවිසැලෙහි සවිකර ඇති අතර එයට අමතරව අදාල නාමපුවරුව ද සවිකර ඇත. අළෙවියට අවශ්‍ය නිර්මාණ තොගයක් දැනට මිලදී ගෙන ඇති අතර ශිල්ප සංවර්ධන අරමුදල කළමනාකරණය කරගනිමින් ඉදිරියේ අළෙවිසැල විවෘත කිරිමට කටයුතු සැළසුම් කර ඇත. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික ශිල්ප සභාවට අයත් මුණියන්ඩි වැව අසල හෙළ කලා ගම්මානය 2021 වර්ෂයේ රු.10,282,061 ක් හා 2022 වර්ෂයේ රු.5,374,639 ක් වශයෙන් එකතු වටිනාකම රු.15,656,700 ක් වැය කර කුටි 14 ක් ඉදිකර තිබුණද විගණන දිනය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ගම්මානය විවෘත කිරීම ප්‍රමාදවීමට Adventure Park සහ සනීපාරක්ෂක පහසුකම් වල ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් මෙම ගම්මානය ඇතුළු සම්පූර්ණ ව්‍යාපෘතිය විවෘත කිරීම ප්‍රමාද වී ඇති බව නගරාධිපති විසින් දන්වා ඇත. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ඉන්දීය රජයේ රු. 18,432,042 ක මූල්‍ය ප්‍රතිපාදන මත 2016 වර්ෂයේ ඉදිකරන ලද කාවන්තිස්සපුර ගම්මානය සඳහා සභාව විසින් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සංවර්ධන කටයුතු සඳහා රු.8,744,211 ක් හා බදු මුදල් වශයෙන් රු.3,072,000 ක් ගෙවා තිබුණද විගණන දින වන විටත් මෙම ගම්මානය නිශ්ක්‍රීයව පැවතුණි. | රටේ පැවැති පාස්කු ප්‍රහාරය හා කොවිඩ් වසංගත හේතුවෙන් දේශීය හා විදේශීය සංචාරකයින්ගේ පැමිණීම මුළුමණින්ම සීමා වීමත් නිසා නැවත හම්බන්තොට දිස්ත්‍රික්කයේ ශිල්පීන් කැඳවා අළෙවිකුටි ශිල්පීන්ට ලබාදීමට උත්සාහ කරන ලදි. | කාවන්තිස්සපුර ගම්මානය ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

### 3.4 ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇසුරුම් පෙට්ටි 20 ක කි.ග්‍රෑ.260 ක බැරැති අත්කම් නිර්මාණ 93 ක් ඩුබායි Expo අලෙවි ප්‍රවර්ධන වැඩසටහන සඳහා යවා තිබූ අතර අත්කම් භාණ්ඩ වලින් නොවිකිණී ඉතිරි වූ තොගය අලෙවි ප්‍රදර්ශනය අවසන් වී මාස 08 ක් ඉක්ම ගොස් ඇතත් ශිල්ප සභාව වෙත ලබා ගැනීමට පියවරගෙන නොතිබුණි. | Expo 2020 ප්‍රදර්ශනයේ ඉතිරි නිර්මාණ තොගය මේ වනවිට කොළඹ වරායට ලගා වී ඇති අතර Ceylon Shipping ආයතනය හරහා නිදහස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | ඉතිරි භාණ්ඩ සභාව වෙත නොපමාව ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |